රෙජිස්ට්‍රාර්/අධ්‍යක්ෂ ජනරාල්/ பணிப்பாளர் நாயகம்/பதிவாளர் Director Genaral/Registrar 011-2864483
අධ්‍යක්ෂ பணிப்பாளர் Director 011-2888424
සහකාර අධ්‍යක්ෂ உதவி பணிப்பாளர் Asst. Director 011-2884612
කාර්යාලය அலுவலகம் Office 011 -2877376
ෆැක්ස් : தொலை நகல Fax 011-2864483

(3ර)

මගේඅංකය எனதுஇல. My No. VSSO/NGO REG/Circula 01

ඔබේඅංකය உமதுஇல. Your No.

දිනය திகதி Date 2022.11. 11

මහජන ආරක්ෂක අමාත්‍යාංශය
பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு
**Ministry of Public Security**

**රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය-15 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල.**
**அரச சார்பற்ற நிறுவனங்களின் தேசிய செயலகம் - 15ஆம் மாடி, சுஹுருபாய,பத்தரமுல்ல.**
**National Secretariat for Non-governmental Organizations - 15th Floor,Suhurupaya,Battaramulla.**

විද්‍යුත් තැපැල්/மின் அஞ்சல்E-mail:ngosecretariat.gov@gmail.com

චක්‍රලේඛ අංක : 07

ලියාපදිංචි අංශයේ නිලධාරීන් වෙත ,

<u>ජාතික මට්ටමේ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම</u>.

උක්ත කරුණ සම්බන්ධයෙන් 2022.11.02 දින ආරක්ෂක අමාත්‍යාංශයේ දී ජාතික බුද්ධි ප්‍රධානි සමඟ සහ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේදී සමාගම් රෙජිස්ට්‍රාර් සමඟ පැවති සාකච්ඡාව හා බැඳේ.

1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ 17 වගන්තිය යටතේ මා වෙත ලබාදී ඇති බලය ප්‍රකාරව මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

මෙම චක්‍රලේඛයේ ප්‍රධාන පරමාර්ථ මෙසේය;

1. ජාතික මට්ටමේ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේදී සිදුවන ප්‍රමාදය වැළැක්වීම පිණිස ද;

2. ව්‍යාපෘති, විදේශ අරමුදල් ප්‍රමුඛතාවය අනුව සෑම රාජ්‍ය නොවන සංවිධානකටම ස්වකීය සංවර්ධන ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම්,අධාර හා අනෙකුත් සහයෝගය දීම පිණිස ද;

**මෙම චක්‍රලේඛය වහාම ක්‍රියාත්මක වන පරිදි බලාත්මක කළ යුතුය.**

**ජාතික මට්ටමේ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය**

අ) සංවිධානය ලියාපදිංචි කරන ලෙස ඉල්ලීම් ලිපියක් ලබාගෙන රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය සහ අනෙකුත් ලේඛණ නිකුත් කිරීම.

ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ හා විදේශ අමාත්‍යාංශයේ නිශ්කාෂණ ලබාගැනීම සඳහා පහත සඳහන් ලේඛණ වල මුල් පිටපත සහ සහතික කළ ඡායා පිටපත් කට්ටල දෙකක් ජාතික ලේකම් කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

i. සංවිධානය විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ,
ii. සාංගමික ව්‍යවස්ථාවලිය (ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කර තිබේනම්)
iii. සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකය හා බලපත්‍රය (ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කර තිබේනම්)
iv. රාජ්‍ය නොවන සංවිධානයේ ව්‍යවස්ථාව (ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කර නොමැති සංවිධාන සඳහා මෙම ලේකම් කාර්යාලයෙන් ලබාදෙන නියමිත ආකෘතියට සැකසිය යුතුය)
v. විදේශ අරමුදල් ලබා දෙන බවට සනාථ කරමින් නිකුත් කරන ලද ලිපි - විදේශ අරමුදල් ලැබෙන සංවිධානයක් නම්

ඇ) 1980 අංක 31 දරණ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ විධිවිධාන අනුව ලියාපදිංචි කළ හැකි සංවිධානයක් නම් ඉහත ලේඛණ ස්ථිර ගොනුවක (Permanent File) ගොනු කළ යුතුය. ඉන්පසු සියලුම වාර්තා පරීක්ෂා කිරීමෙන් පසු ලියාපදිංචි කිරීමට සුදුසු සංවිධාන වල ඉල්ලුම්පත්‍ර හා ඉහත සඳහන් කරන ලද ලේඛණ ආරක්ෂක අමාත්‍යාංශයේ හා විදේශ අමාත්‍යාංශයේ නිශ්කාෂණ ලබාගැනීම සඳහා එම අමාත්‍යාංශ වෙත යැවිය යුතුය.

ඈ) නිශ්කාෂණ වාර්තා ලැබෙන තෙක් ජාතික මට්ටමේ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය කරන අනෙකුත් ලේඛණ ලබාදෙන ලෙස සංවිධාන වෙත උපදෙස් ලබාදිය යුතුය.

i. ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපෘති වාර්තා (අවම වශයෙන් ව්‍යාපෘති වාර්තා දෙකක් ඉදිරිපත් කළ යුතුය.)
ii. අරමුදල් ලබා දෙන පුද්ගලයන්ගේ/ ආයතනවල විස්තර හා එම අරමුදල් ලබාදෙන බවට සනාථ කරමින් නිකුත් කරන ලද ලිපි
iii. පළමු හා අවසන් මහාසභා රැස්වීම් වාර්තා සහ සහභාගීවූවන්ගේ අත්සන් ලේඛණය
iv. සංවිධාන ව්‍යුහය
v. ව්‍යාපෘති සිදුකරනු ලබන දිස්ත්‍රික් දෙකක දිස්ත්‍රික් ලේකම්වරු හෝ ප්‍රාදේශීය ලේකම්වරු දෙදෙනෙකුගෙන් එම ආයතනය ක්‍රියාත්මක වන බව සඳහන් කරමින් ලබාගත් ලිපි දෙකක් (දැනටමත් ස්ථාපනය කර ඇති සංවිධාන සඳහා)
vi. දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් සංවිධානය සම්බන්ධව තත්ව වාර්තා මෙම ලේකම් කාර්යාලය විසින් කැඳවනු ලැබේ. (අළුතින් ආරම්භ කරන ලද සංවිධාන සඳහා)
vii. වාර්ෂික වාර්තා/විගණනය වාර්තා (අළුතින් ආරම්භ කරන ලද සංවිධාන සඳහා අදාල නොවේ)

ඉ) ආරක්ෂක අමාත්‍යාංශයේ හා විදේශ අමාත්‍යාංශයේ නිශ්කාශන වාර්තා ලැබුන පසු එම වාර්තා සහ ඉහත (ඈ) හි සඳහන් අනෙකුත් වාර්තාද ඉදිරිපත් කර තිබේ නම් එම වාර්තා ද පරීක්ෂා කර බලා ගැටළුවක් නොමැති නම් ලියාපදිංචි සහතික පත්‍රය නිකුත් කිරීම.

ඊ) විදේශ අරමුදල් ලැබීම් හා ව්‍යාපෘතියේ ප්‍රමුඛතාවය මත එය අත්‍යාවශ්‍ය කාරණයක් ලෙස අධ්‍යක්ෂ ජනරාල්/ ලේඛකාධිකාරිවරයාට හැඟේනම් නිශ්කාෂණ වාර්තා ලැබෙන තෙක් බැංකු ගිණුමක් විවෘත කිරීම සඳහා අදාල බැංකුව වෙත ලිපියක් නිකුත් කිරීම.

උ) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇති සංවිධානයක් නම්. 1980 අංක 31 දරණ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ ලියාපදිංචි කළ යුතු බැවින් එවැනි සංවිධානවල අරමුණු අනුව රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය නොවන්නේ නම් ලියාපදිංචි කිරීම අවශ්‍ය නොවන බව දන්වා අධ්‍යක්ෂ ජනරාල්/ ලේඛකාධිකාරිවරයාගේ අත්සනින් ලිපියක් නිකුත් කිරීම.

සංජීව විමලගුණරත්න,
අධ්‍යක්ෂ ජනරාල්/ ලේඛකාධිකාරි

පිටපත් -1.සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්

2. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

3. සියළුම දිස්ත්‍රික් රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරකවරු